Alcohol and Drug
Information Centre

ADIC

*No.40/18, Park Road, Colombo 5, Sri Lanka.*
*Tel: +94 11 2584416, +94 11 2592515, Fax: +94 11 2508484*
*E-mail: info@adicsrilanka.org, adicc@sltnet.lk*
*Web Site: http://www.adicsrilanka.org*


**2020/05/14**

**මාධ්‍ය නිවේදනයයි**


# කොවිඩ් වසංගත නිසා රට අකර්මන්‍ය කල කාලය තුළ මද්‍යසාර භාවිතා කරන්නන්ගෙන් 80% ක් සහ දුම්වැටි භාවිතා කරන්නන්ගෙන් 68%ක් භාවිත අඩුකරයි.

මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC) කොවිඩ් 19 කාල සීමාව තුළ මද්‍යසාර (නීත්‍යානුකූල සහ නීති විරෝධී) සහ දුම්වැටි භාවිත කරමින් සිටි පුද්ගලයන්ගෙන් සහ ඔවුන්ගේ පවුල් වල සමාජිකයන්ගෙන් භාවිතය හා ඒ ආශ්‍රිතව සිදු වූ වෙනස්කම් පිළිබඳ සමීක්ෂණයක් සිදු කරන ලදී.

මෙම සමීක්ෂණය මැයි 01 සිට මැයි 10 වෙනි දින දක්වා සමස්ත ශ්‍රී ලංකාව ම ආවරණය වනපරිදි දිස්ත්‍රික්ක 25 තුළ ම මද්‍යසාර සහ දුම්පානය කරන පුද්ගලයන් 2019 දෙනෙකුගේ නියැදියක් යොදා ගන්නා ලදී .





නියැදියෙන් 23%ක් වයස අවුරුදු 21ත්- 24ත් අතර පසුවන්නන්ය. වයස අවුරුදු 25ත්-40ත් අතර ප්‍රමාණය 47%කි. වයස අවුරුදු 40ට වැඩි ප්‍රතිශතය 30% කි.





කොවිඩ් 19 ගෝලීය වසංගත හේතුවෙන් රට අකර්මන්‍ය කල කාලය තුළ මද්‍යසාර භාවිත කරන්නන්ගෙන් 80%ක් ඔවුන්ගේ භාවිතය අඩුකල බව ප්‍රකාශ කර තිබිණි.

මද්‍යසාර භාවිතය අඩුවීමට බලපෑ ප්‍රධාන සාධක





මද්‍යසාර ලබා ගැනීම සීමා කිරීම මද්‍යසාර භාවිතය අඩු කිරීමට ප්‍රයෝජනවත් බව භාවිතය අඩු කළ පුද්ගලයන්ගෙන් 84%ක අදහස වූ අතර, එවැනි විශාල ප්‍රමාණයක් එසේ ප්‍රකාශකරන්නට ඇත්තේ ගෙවුණු කාල සීමාව තුළ සාමාන්‍ය තත්වයක දී භාවිතය නැවැත්වීමේ වාසිය බොහෝ දෙනෙකුට විඳගැනීමට නොහැකි වුවත් මෙවැනි සුවිශේෂී අවස්ථාවක එම අත්දැකීම තුළින් එහි වාසිය බොහෝ දෙනකුට අත්විඳින්නට අවස්ථාව හිමිවූ නිසා යැයි නිගමනය කළහැක.






එසේ සීමා කිරීම භාවිතය අඩු කිරීමට ප්‍රයෝජනවත් වූයේ නැතැයි ප්‍රකාශ කර තිබුනේ 16% පමණි.

මද්‍යසාර භාවිතා කරමින් සිටි පුද්ගලයන්ගේ භාර්යාවන්ගේ ප්‍රතිචාරයන්ට අනුව 49% ප්‍රකාශ කර සිටියේ ස්වාමියාගේ මද්‍යසාර භාවිතය අවමවීම නිවසේ ප්‍රශ්න අඩුවීමට හේතු වු බවයි. පවුල තුළ මුදල් ඉතිරි වු බව 40% ක් ප්‍රකාශ කර තිබිණි.




සමීක්ෂණයේ දී දුම්බීම පිළිබඳ අනාවරණය වු කරුණු අනුව සමස්ත නියැදියෙන් 54%ක් කොවිඩ්-19 වසංගතයට පෙර කාල සීමාව තුළ දී දුම්පානය කළ අය වේ. මෙම ප්‍රස්ථාරයට අනුව 68%ක බහුතර ප්‍රතිචාරකයින් ප්‍රමාණයක් කෝවිඩ්-19 වසංගත කාල සීමාව තුළ දුම්බීම අවම කර ඇත. ඒ අතරින් 48% ක් භාවිතය අඩු කර තිබු අතර සම්පුර්ණයෙන් නැවැත්වු පිරිස 20% කි. මීට බොහෝවිට හේතු විය හැක්කේ දුම්වැටි භාවිතා කරන්නන් වැඩි පිරිසක් මෙම කාලසීමාව තම භාවිතය අඩු කිරීමට හෝ නැවැත්වීමට අවස්ථාවක් කර ගැනීමයි.




දුම්පානය කරන්නන්ගෙන් 51%ක් ම වසංගත තත්වය පහව යාමෙන් පසු ව වුව ද දුම්වැටි භාවිතය අඩු කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වා ගැනීමට සුදානම් බව ප්‍රකාශ කරන ලදී.

සමීක්ෂණයේ සමස්ථ ප්‍රතිඵලය අනුව කොවිඩ් වසංගත නිසා රට අකර්මන්‍ය කල කාලය තුළ මද්‍යසාර භාවිතා කරන්නන්ගෙන් 80% ගේ භාවිතය අඩු වු අතර දුම්වැටි භාවිතය 68%කින් අඩු වි ඇත.


මද්‍යසාර භාවිතය අඩු කල අයගෙන් 37% ක් ම වසංගත තත්වය පහව යාමෙන් පසුව වුව ද මද්‍යසාර භාවිතය අඩු කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වා ගැනීමට සුදානම් බව ප්‍රකාශ කරන ලදී.

දුම්පානය කරන්නන්ගෙන් 51%ක් ම වසංගත තත්වය පහව යාමෙන් පසු ව වුව ද දුම්වැටි භාවිතය අඩු කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වා ගැනීමට සුදානම් බව ප්‍රකාශ කරන ලදී.

මද්‍යසාර භාවිතා කරමින් සිටි පුද්ගලයන්ගේ භාර්යාවන්ගේ ප්‍රතිචාරයන්ට අනුව 49% ප්‍රකාශ කර සිටියේ ස්වාමියාගේ මද්‍යසාර භාවිතය අවමවීම නිවසේ ප්‍රශ්න අඩුවීමට හේතු වු බවයි. පවුල තුළ මුදල් ඉතිරි වු බව 40% ක් ප්‍රකාශ කර තිබිණි.

මේ අනුව පෙනි යන්නේ මද්‍යසාර සහ දුම්වැටි ලබා ගැනීමට ඇති ඉඩකඩ අඩු වීම භාවිතා කරමින් සිටින්නන්ගේ භාවිතය අඩු කිරීමට හෝ නැවැත්වීමට හේතු වන බවයි. සාමාන්‍ය අවස්ථාවලදී භාවිතයෙන් ඉවත්වී සිටීමට සහ එම අත්දැකීම ලබා ගැනීමට අපහසු වුවත් කොවිඩ් 19 වසංගත නිසා අකර්මන්‍ය කාල සීමාවේදී භාවිතයෙන් ඉවත් වී සිටීමේ අත්දැකීම විද ගැනීමට ලැබුණු පාරිසරික පෙළඹවීම භාවිතයෙන් නිදහස් වීමේ පහසුව අත්දැකීමට අවස්ථාවක්වු බවයි.

ලෝකය පුරා මද්‍යසාර හා දුම්වැටි කර්මාන්තකරුවන් එම ද්‍රව්‍ය ලබා ගැනීමට සීමාවන් පැණවීමට හැම විටම විරුද්ධ වන්නේ බෝහෝ භාවිත කරන්නන් එම ද්‍රව්‍ය නොමැතිව ජීවත් වීමට හැකි බව තේරුම් ගැනීම සහ විශේෂයෙන්ම එම ද්‍රව්‍යන්ගෙන් නිදහස් වීම ජීවිතය පහසු කරවන්නක් බව තේරුම් ගෙන භාවිතයෙන් ඉවත් වන බැවිනි.




පුබුදු සුමනසේකර

විධායක අධ්‍යක්ෂක

මද්‍යසාර හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය

40/18 උද්‍යාන පාර

කොළඹ 05